# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1885/30 - 2014 ඔක්තෝබර් මස 21 වැනි අඟහරුවාදා - 2014.10.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

20(4) වන වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 20(4) වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර උසස් අධ්‍යාපන අමාත්‍ය දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක වන මා විසින්, ශ්‍රී ලංකාවේ නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ත්‍රිකුණාමල මණ්ඩපයේ කටයුතුවල පරිපාලනය බරපතල ලෙස අවුල් වී ඇති බවට සැහීමකට පත්වීමෙන් පසු, එකී පනත යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියමයක්, නියමාවලියක්, ප්‍රඥප්තියක්, අතුරු ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් යටතේ ත්‍රිකුණාමල මණ්ඩපයේ මණ්ඩපාධිපති වෙත පිරිනමන ලද, පනවන ලද හෝ පවරන ලද පිළිවෙලින් යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, ඉටු කිරීමේ හෝ කිරීමේ කාර්යය සඳහා එකී මණ්ඩපාධිපති වෙනුවට නිසි බලධරයා වශයෙන් මහාචාර්ය රංජිත් ප්‍රේමලාල් ද සිල්වා 2014 ඔක්තෝබර් මස 15 වන දින සිට බලපැවැත්වෙන පරිදි මේ නියමය මගින් පත් කරමි.

දිසානායක මුදියන්සේලාගේ සුමනවීර බණ්ඩා දිසානායක,
උසස් අධ්‍යාපන අමාත්‍ය.

2014 ඔක්තෝබර් මස 17 වැනි දින,
කොළඹ දී ය.

11-91

1A - PG 2210— 500 (2014/10)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*